# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,964 - 2016 අප්‍රේල් මස 22 වැනි සිකුරාදා - 2016.04.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 484 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 487 |


*සැ. යු.* - සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත් කෙටුම්පත 2016 ජනවාරි මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මැයි මස 13 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අප්‍රේල් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**මොරටුව දිසා අධිකරණයේ දී ය**

මොරටුව, කඩලාන, ගල්පිටහබොඩ පාර, අංක 72 හි පදිංචි ගලප්පත්තිගුරුගේ කොන්ස්ටන් හෙන්රි සිල්වා.

නඩු අංකය : 94/උකස්.

................................*පැමිණිලිකරු.*

*එදිරිව*

මොරටුව, උයන නිවාස ක්‍රමයේ පීරිස් වත්තේ, අංක 04 හි පදිංචි,
පෙතියාගොඩ දිද්දෙනිගෙදර විලාසිණි දිල්රුක්ෂි *හෙවත්* දිලාසිණි දිල්රුක්ෂි

................................ *විත්තිකාරිය.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2013ක් වූ ජූලි මස 03 දින දරන තීන්දු ප්‍රකාශය පරිදි රුපියල් ලක්ෂ පහක (රු. 5,00,000) මුදලක් හා වර්ෂ 2011 ක් වූ පෙබරවාරි මස 27 වැනි දින සිට එම මුදලට මසකට සියයට හය (6%) බැගින් වූ පොලිය ද, පැමිණිල්ලේ දින සිට සම්පූර්ණ මුදල හා පොලිය ඇතුළුව මුලු මුදලම ගෙවන දින දක්වා සියයට දහඅට (18%) බැගින් වූ වාර්ෂික පොලිය ද, විත්තිකාරිය විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට විධාන කරමින් අණකොට කරන ලද තීන්දු ප්‍රකාශය පරිදි ක්‍රියා කිරීමට විත්තිකාරිය අපොහොසත් වී ඇති බැවින්, පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රයන් ද හිමිකම් සහ අයිතිවාසිකම් වර්ෂ 2016 ක් වූ මැයි මස 04 වැනි දින ප. ව. 1.30ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*ඉඩමට පිවිසීම.-* මොරටුව රාවතාවත්ත ගාලු පාරේ බෝගහ හන්දියෙන් බස්නාහිරට පිහිටි ලුනාව පාරට හැරී, ලුනාව පාරේ කෙලවර පිහිටි, උයන පාරේ දකුණට හැරී, ලුනාව රෝහලට පිවිසීමට පෙර ඇති පීරිස් මාවත දිගේ ඉදිරියට ගොස් වම් අත පැත්තේ පහලට යෑමට ඇති අඩි 8ක් පලල පාරේ දෙවනියට පිහිටි වරිපනම් අංක 118/4 ලෙසට එම පාරට මුහුණ ලා අදාළ වම් පැත්තේ දෙමහලකින් යුත් අදාළ දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය :*

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ඉඩම් මිලදී ගත් වහාම ගෙවිය යුතු අතර ඉතිරි 75%ක මුදල දින 30ක් ඇතුළත දී මොරටුව දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය,
2. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු,
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තුව 2.5% (සියයට දෙකයි දශම පහයි),
5. වෙන්දේසිකරුගේ ගමන් ගාස්තු,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තු,
7. ප්‍රාදේශීය සභා ගාස්තු වෙන්දේසි මුදලින් 1%ක් ගැණුම් මුදල ගෙවීමෙන් ද තම වියදමින් මෙම දේපල පවරා ගැනීමෙන් ද පසුව ගැණුම්කරු විසින් දේපලේ සන්තකය ලබා ගත යුත්තේ ය.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහා නගර සභා සීමාව තුළ උයන යන ගම පිහිටි වරිපනම් අංක 118/4 උයන පාර, දකුණ සර්වේ ජනරාල් වෙනුවෙන් ජේ. රඹන්පොල අවසරලත් මිනින්දෝරු මහතා විසින් 1986 අගෝස්තු 26 වැනි දින මැන සාදන ලද අංක CO/6442 දරන පිඹුරේ සඳහන් පිරිස්ගේ වත්ත නමැති ඉඩමේ කැබලි අංක 4 දරන ඉඩමට මායිම්ව, උතුරට : මොරටුව හෝලි එම්මානුවෙල් දේවස්ථානයට අයිති යයි කියන කැබලි අංක 80 උයන පාරේ ඉඩම, නැගෙනහිරට : කැබලි අංක 05 (පාරක් සඳහා වෙන්කළ) දකුණට : කැබලි අංක 02 සහ 03 සහ බස්නාහිරට : කැබලි අංක 01 යන මෙකී මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි බිංදුවයි හතර (හෙක්ටයාර් 0.0104) විශාල ඉඩම සහ එහි පිහිටි දෙමහල් ගොඩනැගිල්ල සහ ගහකොළ පළතුරු ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1994/273 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

එම්. දික්කුඹුර මුහන්දිරම්ගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මොරටුව.

04-801

---

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පීඑල්සී
(කලින් ලංකා ඔරික්ස් ෆිනෑන්ස් කම්පැණි පීඑල්සී යනුවෙන් නම්කර හඳුන්වනු ලැබූ)
අංක : 100/1-1/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.
(සමාගමේ නව අංකය : PB 244 PQ)

නඩු අංකය : HC (සිවිල්/119/2013 එම්.ආර්.
ඇස්කිසි අංකය : 09/16

................................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. ඉන්ඩිකෝල් ස්ටීල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, අංක 326, 1 වන මහල, පරණ යොන් විදිය, කොළඹ 12.
02. මාරසිංහගේ මහින්ද වීරරත්න සහ මාරසිංහගේ වීරරත්න යනුවෙන් ද හඳුන්වනු ලබන, අංක 227/14ඒ, නිර්මාණ මාවත, එතෙර නාවල පාර, නුගේගොඩ.

................................ *විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2014ක් වූ අප්‍රේල් මස 29 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව, එකී 1 වැනි විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයකර ගන්නට කියා නියම කළ රු. 19,926,585 ක මුදල සහ වර්ෂ 2013.02.08 වැනි දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා මසකට 4% බැගින් පොලිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය සහ නඩු ගාස්තු අධිකරණයට මැනවැයි හැඟෙන වෙනත් සහ වැඩිදුරටත් වන සහන අයකර ගැනීම සඳහා ද, තව ද එකී 1 වැනි විත්තිකරු විසින් දනටමත් රු. 4,850,000 ක මුදලක් පැමිණිලිකරුට ගෙවා ඇති අතර එය අඩුකර අයකර ගැනීම සඳහා මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල වර්ෂ 2016ක් වූ මැයි මස 24 දින

ප. ව. 2.30ට එම ඉඩම පිහිටා ඇති අංක 227/14ඒ, නිර්මාණ මාවත, එතෙර නාවල පාර, නුගේගොඩ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර නගර සභා සීමාවේ සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, නුගේගොඩ ග්‍රාමයෙහි පිහිටි ''තිඹිරිගහවත්ත'' සහ ''තුන්හවුල් දෙල්ගහවත්ත'' නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා විසින් මැන සාදන ලද වර්ෂ 1998.11.20 වැනි දිනැති සහ අංක 108/1998 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 227/15 දරන පරිශ්‍රය ද, නිර්මාණ මාවත ද, නැගෙනහිරට : අඩි 30 පළල පාර ද, දකුණට : ලොට් අංක 02 සහ බස්නාහිරට : මෙන්ඩිස් කුරේගේ උරුමක්කරුවන්ට අයත් දේපල ද, මායිම් වූ පර්චස් නමයයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 9.75) ක ප්‍රමාණයෙන් යුත් බෙද වෙන් කරන ලද බිම් කැබැල්ල සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේ ද සමග වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඒ 144/18 හි ලියාපදිංචි කර ඇත.

ඉහත දැක්වෙන ඉඩම මෙහි පහත දැක්වෙන ඉඩමෙන් නිශ්චිතව මැන බෙදා වෙන්කළ උප කොටසක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කෝට්ටේ නගර සභා සීමාවේ සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, නුගේගොඩ පිහිටි ''තිඹිරිගහවත්ත'' සහ ''තුන්හවුල් දෙල්ගහවත්ත'' (බලයලත් මිනින්දෝරු ජී. පී. පී. වීරරත්න විසින් මැන සාදන ලද වර්ෂ 1922.04.01 වැනි දින සහ අංක 4544 දරන පිඹුරෙන් ඒකාබද්ධ කරන ලද ඉඩමෙහි නිශ්චිත බෙදා වෙන් කරන ලද උප කොටසකි) නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සකස් කරන ලද අංක 1587 සහ වර්ෂ 1971.09.24 වැනි දිනැති පිඹුරේ ලොට් අංක 08 දරන කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : පිඹුරු අංක 1587 හි ලොට් 07 දරන කොටස ද, දකුණු-නැගෙනහිරට : පිඹුරු අංක 1587 හි ලොට් බී ද, දකුණු-බටහිරට : පිඹුරු අංක 1587 හි ලොට් 09 සහ උතුරු-බටහිරට : මෙන්ඩිස් කුරේගේ උරුමක්කාරයින්ට අයත් ඉඩම ද, මායිම් වූ පර්චස් දහඅටයි දශම පහයි පහ (අ. 0, රූ. 0, පර්. 18.55) ක ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල සහ ඒ තුළ පිහිටි ගහකොළ වැවිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු M 1071/15 හි ලියාපදිංචි කර M 1071/205ට ඉදිරියට ගෙන ගොස් ඇත.

මෙහි පහත දැක්වෙන ඉඩම මතින් යෑම් ඊම් සහ සමාන මාර්ග අයිතිවාසිකම් සමග වේ.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කෝට්ටේ නගර සභා සීමාවේ සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, නුගේගොඩ පිහිටි ''තිඹිරිගහවත්ත'' සහ තුන්හවුල් දෙල්ගහවත්ත'' නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද වර්ෂ 1971.09.24 වැනි දිනැති සහ අංක 1587 දරන පිඹුරේ ලොට් අංක A (පාර සඳහා වෙන් කරන ලද කොටස) දරන කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 231/1 සහ 229 දරන ඉඩම, නාවල පාර ද, නැගෙනහිරට : ලොට් අංක 01 සහ 02 දරන කොටස් ද, දකුණට : ලොට් B දරන කොටස ද, සහ බස්නාහිරට : වරිපනම් අංක 229 සහ 231/1 දරන ඉඩම, නාවල පාර ද, මායිම් වූ පර්චස් දහඅට (අ. 0, රූ. 0, පර්. 18) ක ප්‍රමාණය මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු M 1607/247 හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කෝට්ටේ නගර සභා සීමාවේ සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, නුගේගොඩ පිහිටි ''තිඹිරිගහවත්ත'' සහ ''තුන්හවුල් දෙල්ගහවත්ත'' නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද වර්ෂ 1971.09.24 වැනි දිනැති සහ අංක 1587 දරන පිඹුරේ ලොට් අංක B (පාර සඳහා වෙන් කරන ලද කොටස) දරන කොටසට මායිම් , උතුරට : 3, 8 සහ C ද, නැගෙනහිරට : A,B,E,10,13,14,17 සහ 18 දරන කොටස් ද, දකුණට : D,E,10,5,14,17 සහ 18 දරන කොටස් ද සහ බස්නාහිරට : 3 සිට 9 සහ C ද, මායිම් වූ පර්චස් පහයි දශම තුනයි හය (අ. 0, රූ. 0, පර්. 5.36) ක ප්‍රමාණය වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු M 1607/246 හි ලියාපදිංචි කර ඇත.

ප්‍රේමසිරි වඩුගේ,<br>
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,<br>
වාණිජ මහාධිකරණය,<br>
කොළඹ.

2016 ක් වූ මාර්තු මස 23 වැනි දින දී ය.

04-785

---

### කොළඹ දී පැවැත්වෙනු ලබන හා සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී.එල්.සී.<br>
(කලින් සෙලින්කෝ ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්)<br>
සහ<br>
සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ්,<br>
අංක 18, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10<br>
*සහ*<br>
කලින් අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01

..................................*පැමිණිලිකරු.*

නඩු අංකය :<br>
CHC/667/09/MR

*එදිරිව*

01. සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්<br>
අංක 15ඒ, ඇල්ප්‍රඩ් පෙදෙස, කොළඹ 03<br>
*සහ*<br>
අංක 283, ආර්. ඒ. ද මැල් මාවත,<br>
කොළඹ 03

02. සෙලින්කෝ හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පණි පීඑල්සී<br>
අංක 151, ධර්මපාල මාවත, කොළඹ 07 සහ<br>
අංක 97, හයිඩ් පාර්ක් කෝනර්, කොළඹ 02

03. සෙලින්කෝ කොන්ඩොමිනියම්ස් ලිමිටඩ්<br>
අංක 151, ධර්මපාල මාවත, කොළඹ 07<br>
*සහ*<br>
අංක 153, ඇල්විටිගල මාවත, කොළඹ 08.

................................... *විත්තිකරුවන්.*

ඉහත අංකය දරන නඩුවේ වර්ෂ 2013ක් වූ ජනවාරි මස 18 වැනි දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය පැමිණිලිකරුගේ වාසියට සහ ඉහත නම් සඳහන් 1 වැනි 2 වැනි සහ 3 වැනි විත්තිකරුවන්ට එරෙහිව ඇතුළත් කර ඇත.

ඒ අනුව ඉහත නම් සඳහන් 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකරුවන් විසින් එක්ව සහ වෙන්ව පැමිණිලිකරුට පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි රු. 56,120,663.7 ක මුදලක් ද සහ රු. 50,000,000 ක් වූ මුල් මුදල මත 2009 අගෝස්තු මස 01 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක්, මසකට 4%ක පොලිය ද සමඟ නඩු ගාස්තු 1 වැනි 2 වැනි සහ 3 වැනි විත්තිකරුවන් විසින් පැමිණිලිකාර ආයතනය වෙත ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තව ද, පැමිණිල්ලේ ආයාචනයේ (ඇ) ඡේදයේ අයැද ඇති පරිදි තීන්දු ප්‍රකාශයේ උපලේඛනයේ විස්තර කර ඇති සහාධිපත්‍ය පාර්ශල් සහ/හෝ සහාධිපත්‍ය ඒකක ද එයට සම්බන්ධ පොදු අංගවලට වූ අයිතිවාසිකම් ද ඒ ගැන සාමාන්‍යයෙන් දරනු ලබන අයිතිව තිබෙන පාවිච්චි කරනු ලබන හෝ භුක්ති විඳිනු ලබන එයට අයිති හෝ කවර හෝ ආකාරයකින් සම්බන්ධ එක් එක් හා සියලු අයිතිවාසිකම්, මාර්ග, පරවශ්‍යතා ප්‍රයෝජන අයිතීන් හා අනුබන්ධනය ද, එකී සහාධිපත්‍ය ඒකක එහි සෑම කොටසක් හෝ පංගුවක් විෂයෙහි ඒ මත හෝ එයින් 1 වැනි 2 වැනි සහ 3 වැනි විත්තිකරුවන් සතු ඉඩකඩම්, අයිතිවාසිකම්, හිමිකම් සම්බන්ධතා දේපළ හිමිකම් පෑම් හා ඉල්ලීම් ද ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එස්. මුදලි මහතා විසින් ලියා අත්සන් කරන ලද අංක 3434 හා 2008 දෙසැම්බර් මස 16 වැනි දින දරන උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාරව පැමිණිලිකාර ආයතනයට 1, 2 සහ 3 වැනි විත්තිකරුවන්ගෙන් ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා බැඳී ඇති බවටත් ක්‍රියාවේ යෙදවිය හැකි බවටත්, විකිණිය හැකි බවටත් වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

එම තීන්දු ප්‍රකාශයේ අඩංගු නියෝගයන් හා කොන්දේසිවලට අනුකූලව සහ අධිකරණයේ අනුමත විකිණීමේ කොන්දේසි මත මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති සහාධිපත්‍ය දේපළ සහ ස්ථානය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ගරු අධිකරණය විසින් මා පත් කොට සංස්ථාපනය කර ඇති හෙයින් පහත උපලේඛනයේ විස්තර කර ඇති සහාධිපත්‍ය දේපළ සහ ස්ථානය ඒවා පිහිටි ස්ථානයේ දී එනම්, කොළඹ මහ නගර සභා සීමාව තුළ නාරාහේන්පිට අංක 34 කොට්ඨාසයේ ඇල්විටිගල මාවත, වරිපනම් අංක 153/6 3/6 යන ස්ථානයේ දී 2016.05.20 වැනි දින ප. ව. 2.30ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තව ද, මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපල මිලදී ගන්නා ගැණුම්කරු වෙන්දේසි මුදලින් 25%ක් ද, වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු එම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර, ඉතිරි 75% දින 30ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

*දේපලට ප්‍රවේශ මාර්ගය* : කොළඹ නගර සභාව සීමාවේ නාරාහේන්පිට මැනිං ටවුන් හි බොරැල්ල සිට නාරාහේන්පිට යාමට ඇති ඇල්විටිගල මාවතේ ප්‍රධාන පාරට මායිම්ව මෑතක දී ඉදිකල ට්‍රිලේනියම නමින් හඳුන්වන නිවාස සංකීර්ණය තුළ මෙම නිවස පිහිටා ඇත.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත අංක 34, නාරාහේන්පිට, කොට්ඨාසයේ පිහිටියා වූ ද, ඇල්විටිගල මාවතේ, වරිපනම් අංක 153/6 3/6 දරන්නා වූ ද බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර විසින් සාදන ලද අංක 2825 හා 2007 නොවැම්බර් මස 10 වැනි දින දරන අර්ධ සහාධිපත්‍ය පිඹුරේ 2 බී/එෆ්3/පී6 වශයෙන් සලකුණු කොට ඇති (3 වන මහලේ පිහිටි) ඉහත විස්තර කර ඇති සහාධිපත්‍ය දේපලේ (බී) සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ පාර්සලයක් හෝ ඒකකයක් වන සියලු පාර්සලයට හෝ ඒකකයට මායිම් පහත දක්වෙන පරිදි වේ.

උතුරට : මෙම පාර්සලය හෝ ඒකකය සී ඊ - 1 පොදු අංගය ඉහළින් වූ අවකාශයෙන් වෙන් කරන බිත්තිය නැගෙනහිරට මෙම පාර්සලය හෝ ඒකකය සී ඊ - 2 බී 16 දරන පොදු අංගයන් වෙන් කරන බිත්තිය හා - 2බී/එෆ්3/පී5 පාර්සලය හෝ ඒකකය වෙන් කරන බිත්තියේ මාධ්‍යය දකුණට : මෙම පාර්සලය හෝ ඒකකය සීඊ-2බී16 පොදු අංගයෙන් වෙන් කරන බිත්තිය සහ 2බී/එෆ්3/පී5 පාර්සලය හෝ ඒකකය වෙන් කරන බිත්තිය හා මෙම පාර්සලය හෝ ඒකකය සීඊ-2බී11 පොදු අංගය ඉහළ වූ අවකාශයෙන් වෙන් කරන බිත්තිය බස්නාහිරට මෙම පාර්සලය හෝ ඒකකය සීඊ-2බී11 පොදු අංගය ඉහළින් වූ අවකාශයෙන් වෙන් කරන බිත්තිය.

මුදුන : 2බී/එෆ්4/පී6 පාර්සලය හෝ ඒකකය වෙන් කරන පොලවේ මධ්‍යය

පත්ල : 2බී/එෆ්2/පී6 පාර්සලය හෝ ඒකකය වෙන් කරන පොලවේ මධ්‍යය

වර්ග මීටර් 166.00 ක බිම් ප්‍රමාණයකින් සමන්විත වේ.

මෙම පාර්සලය හෝ ඒකකය සමන්විත වන්නේ විසිත්ත කාමරය, කෑම කාමරය, නිදන කාමර 3, වැසිකිලි 2. නවීන මුලුතැන් ගෙය, අතවැසි වැසිකිලිය, අතවැසි කාමරය, සඳලුතල 2 කින් හා මිදුලකිනි.

මෙම පාර්සලයේ හෝ ඒකකයේ පොදු අංගෝපාංගවලට අදාළ මෙම ගොඩනැගිල්ලේ නොබෙදූ කොටස් අගය 0.87% කි.

මෙම පාර්සලයේ හෝ ඒකකයේ පොදු අංගෝපාංගවලට අදාළ මෙම සහාධිපත්‍ය දේපලේ නොබෙදූ කොටස් අංගය 0.34%කි.

මෙම පාර්සලයට හෝ ඒකකයට තිබෙන ලඟම පොදු ප්‍රදේශය ප්‍රවේශ සීඊ-2බී16 වේ.

මෙම පාර්සලය හෝ ඒකකය බී ගොඩනැගිල්ලේ පාර්සලයකි හෝ ඒකකයකි. අමතර පාර්සල් හෝ ඒකක 2බී/එෆ්3/පී6/ඒ3 (රථගාල) සමඟ වෙන් කර දෙයි.

ලියාපදිංචි වී තිබෙන්නේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සහාධිපත්‍ය දේපල එස්/ඒ1/193 හි ය.

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමදන විනිසුරු (මුළු දිවයිනටම),
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

2016 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

04-952

# විවිධ දැන්වීම්

**(සිය සිවිල් අධිකරණ බලය) කොළඹ දී ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය**

*නඩු අංකය :* HC (Civil) 49/14/CO
*ස්වභාවය :* ගණන් බේරා වසා දැමීම.
*කාර්ය පරිපාටිය :* වට්නාකම :

කොළඹ 12, පරණ යොන් වීදියේ, අංක 57 දරන ස්ථානයේ, පල්ලිගොඩ ට්‍රේඩිං කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

*සහ*

පල්ලිගොඩ ට්‍රේඩිං කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් ගණන් බේරා වසා දැමීම පිණිස 2007 අංක 07 දරන සමාගම් පනතේ 270(ඊ) වගන්තිය සමඟ කියවිය යුතු 534 වගන්තිය යටතේ කරනු ලබන අයදුම්පතක් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

නෙදර්ලන්තයේ බ්‍රීඩා මයුරිට්ස්ට්‍රාට් 4811 EN, හි එනර්ජි කොමර්ස් බී. වී.

.......................................... *පෙත්සම්කරු.*

කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත් මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, 2014 ක් වූ නොවැම්බර් මස 10 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් ඩී. එල්. සහ එෆ් ද සේරම් මහතුන් විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2016ක් වූ සැප්තැම්බර් මස 06 වැනි දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති, එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එල්. සහ එෆ් ද සේරම් මහත්වරු,
අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 07.

*සටහන.-* එකී පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් ඩී. එල්. සහ එෆ් ද සේරම් මහතුන් වෙත බාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතු ය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2016ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින සවස 6.00ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතු ය.

04-837

---

**සිසිර ජයකොඩි සියපත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

පද්ම උදයශාන්ත ගුණසේකර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 48(1) දරන ස්ථාවර නියෝගය යටතේ ''සිසිර ජයකොඩි සියපත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* අඟහිඟකම් ඇති පාසල් දරුවන්ගේ අධ්‍යාපනය පෙරපාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා අවශ්‍ය ආධාර හා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම,

*(ආ)* ස්වයං රැකියා දිරිගැන්වීම සඳහා විවිධ පාඨමාලා, දේශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම,

*(ඇ)* විවිධ ආගමික සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට කැමති අසරණ පුද්ගලයින්ට අවශ්‍ය ගමන් පහසුකම් සැලැස්වීම.

පද්ම උදයශාන්ත ගුණසේකර,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

04-763

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.